## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022.09.08 වන දින පැවැති මාසික මහා සභා රැස්වීම් වාර්තාව.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම 2022 සැප්තැම්බර් මස 08 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු උපසභාපති | - | ඩී.වී.උපාලි මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.ආරියරත්න මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.බිමල්ක ප්‍රමෝද්‍යා මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.පියසේන මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සෙල්වනායගම් රගවන් මැතිතුමා. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා. |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 36. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 37. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා , ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01. පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම. ( 2022.08.18)**

2022.08.18 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් , සංශෝධන නොමැති නම් එම වාර්තාව සභා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඒ අනුව 2022.08.18 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදනය.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ නායක ධුරය සඳහා ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මහතා පත් කර ඇති බවට එක්සත් ජාතික පක්ෂයේ මහලේකම් පාලිත රංගේ බණ්ඩාර මැතිතුමා එවා ඇති ලිපිය ගරු සභාවට ඉදිරිපත් කිරීම.

**03. සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

I. ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.

01.2022 වර්ෂය සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු වත්කම් වන සතිපොළ සංකීර්ණය හා සතිපොළ අසල රථ ගාල ටෙන්ඩර් කිරීමක් සිදු නොකර එම වත්කම්හි මුදල් අය කිරීම සභාව විසින් සිදු කළ අතර පොදු වෙළෙඳපොළ අංක 14 දරණ මාළු කඩ කාමරය පමණක් 2022 වර්ෂය සඳහා ටෙන්ඩර් කරන ලදී.එහි දී තක්සේරු කරන ලද වාර්ෂික කුලිය පහත දැක්වේ.

| අනු අංකය | ස්ථානය | 2021.11.09 වන දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ඇති වාර්ෂික කුලිය (රු.) | 2022.08.31 දිනට ආදායම |
|---|---|---|---|
| 01 | සතිපොළ සංකීර්ණය 5-23 II | රු.1,365,000.00 | රු.788,150.00 |
| 02 | පොදු වෙළඳපොළ අංක 14 දරණ මාළු කඩ කාමරය 5-231 | රු. 300,000.00 | රු. 76,750.00 |
| 03 | සති පොළ අසල රථගාල 5-43 (පාසල් බස් රථ සමඟ) | - | රු. 66,910.00 |

2023 වර්ෂය සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු වත්කම් ටෙන්ඩර් කිරීමට හෝ සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය පවසා සිටියේ අනවශ්‍ය මාළු කඩ ඉවත් කළ යුතු බවත් එවිට සභාවට එමඟින් ආදායමක් ලබා ගත හැකි බවත් ය.ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ අනවශ්‍ය මාළු කඩ නොමැති බවත් , ප්‍රාදේශීය සභාවෙන් බලපත්‍ර ලබා ගත් මාළු කඩ පමණක් ඇති බවත් , ව්‍යාපාරයක් සිදු කරන විට ස්ථානීය පරීක්ෂාවක් සිදු කර ඒ සඳහා ප්‍රාදේශීය සභාවෙන් බලපත්‍රයක් නිකුත් කරන බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ලෙල්ලොපිටියෙහි එකම ස්ථානයක ලොරි දෙකකින් මාළු විකුණන බව ය.ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ කරදිය සහ මිරිදිය මාළු වර්ග එම ලොරි දෙක මඟින් විකුණන බවත් , දැනට මාළු වෙළෙඳසැල් මඟින් වෙළඳ බලපත්‍ර ගාස්තු පමණක් අය කරන බවත් , අතුරු ව්‍යවස්ථාවක් පනවා ගෙන නොමැතිව වෙනත් මුදලක් ඒවායින් ලබා ගත නොහැකි බවත් , විශේෂයෙන් ම මිරිදිය මාළු ප්‍රවර්ධනය කරන ලෙසට දන්වා ඇති බවත් , කුට්ටපිටියේ මිරිදිය මසුන් ඇති කරන ස්ථානයක් පවත්වා ගෙන යන බවත් ය.

<u>**තීරණ අංක 01 – i**</u>

2023 වර්ෂය සඳහා පැල්මඩුල්ල සතිපොල ආදායම් පරීක්ෂකතුමිගේ අධීක්ෂණය යටතේ සභාව මගින් මුදල් එකතු කර පවත්වා ගෙන යාම සුදුසු බවට සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

<u>**තීරණ අංක 01 – ii**</u>

2023 වර්ෂය සඳහා මාළු කඩය ටෙන්ඩර් කිරීමේ දී 2021.11.09 වන දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ඇති වාර්ෂික කුලිය අවම මුදල ලෙස තීරණය කර ටෙන්ඩර් කිරීම සුදුසු බවට සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

<u>**තීරණ අංක 01 – iii**</u>

2023 වර්ෂය සඳහා සතිපොල අසල රථගාල ආදායම් පරීක්ෂකතුමිගේ අධීක්ෂණය යටතේ සභාව මගින් මුදල් එකතු කර පවත්වා ගෙන යාම සුදුසු බවට සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**02.** සබරගමුව පළාත් මහාධිකරණයේ අංක 08/2022 දරණ රිට් නඩුව 2022.07.07 දින අධිකරණයේ කැඳවූ අතර එදින අප සභාව වෙනුවෙන් පෙනී සිට දින ලබා ගැනීම වෙනුවෙන් රු.3,000.00 ක මුදලක් ද 2022.07.28 දින අප සභාව වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටිමින් නව පෙරකලාසි ගොනු කර නඩුවේ පියවර අයදීම වෙනුවෙන් රු.10,000.00ක මුදල ද ඇතුළුව රු.13,000.00 ක මුළු මුදල නීතිඥ ප්‍රියන්ත කරුණාතිලක මහතාට ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ නඩු පිළිබඳව අධීක්ෂණයෙන් සිටිය යුතු බවත් , නඩු පිළිබඳව මන්ත්‍රීවරුන් දැනුවත් කළ හැකි ක්‍රමවේදයක් සකස් කළ යුතු බවත් ය.

<u>**තීරණ අංක 02**</u>

2022.07.07 දින අධිකරණයේ කැඳවූ සබරගමුව පළාත් මහාධිකරණයේ අංක 08/2022 දරණ රිට් නඩුව සඳහා අප සභාව වෙනුවෙන් පෙනී සිට දින ලබා ගැනීම වෙනුවෙන් රු.3,000.00 ක මුදලක් ද , 2022.07.28 දින අප සභාව වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටිමින් නව පෙරකලාසි ගොනු කර නඩුවේ පියවර අයදීම වෙනුවෙන් රු.10,000.00ක මුදලක් ද ඇතුළුව රු.13,000.00 ක මුළු මුදල නීතිඥ ප්‍රියන්ත කරුණාතිලක මහතාට ගෙවීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**03.** පැල්මඩුල්ල දිස්ත්‍රික් උසාවියේ නඩු අංක 6840/L වෙනුවෙන් 2022.06.10 දින පෙනී සිටීම වෙනුවෙන් රු.10,550.00ක බිල්පත් මුදල නීතිඥ ප්‍රදීප් මංගල මහතාට ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 03**</u>

පැල්මඩුල්ල දිස්ත්‍රික් උසාවියේ නඩු අංක 6840/L වෙනුවෙන් 2022.06.10 දින පෙනී සිටීම වෙනුවෙන් රු.10,550.00ක බිල්පත් මුදල නීතිඥ ප්‍රදීප් මංගල මහතාට ගෙවීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**04.** 2023 වර්ෂය සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පහත සේවාවන් හා පහසුකම් ගාස්තු සංශෝධනය කිරීමට යෝජනා කරමි.

| සපයන සේවාව හෝ පහසුකම | පැවති ගාස්තුව | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| වරිපනම් නම් වෙනස් කිරීමේ පෝරම ගාස්තු | රු. 500.00 | රු.1500.00 |
| විථි රේඛා සහ ගොඩනැගිලි සීමා ගාස්තු | රු.1000.00 | රු.1500.00 |
| වරිපනම් ගෙවන බවට සහතික නිකුත් කිරීම | රු. 500.00 | රු.1000.00 |
| විදුලිය ලබා ගැනීම සඳහා සහතික නිකුත් කිරීම | රු. 250.00 | රු. 500.00 |
| ලේඛන වල පිටපත් නිකුත් කිරීම | රු. 100.00 | රු. 150.00 |
| වසර දෙකකට වඩා පැරණි ලේඛන සෙවීමට වර්ෂයකට | රු. 50.00 | රු. 100.00 |
| වරිපනම් නොගෙවන බවට සහතික නිකුත් කිරීම | රු. 100.00 | රු. 150.00 |
| අනතුරු දායක ගස් ඉවත් කිරීමේ පෝර්ම ගාස්තු | රු. 450.00 | රු. 750.00 |
| ජල බවුසරය ලබා දීම (ලී.5000) දිනකට | රු.5000.00 | රු.7500.00 |
| අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා ගාස්තු | රු.1500.00 | රු.5000.00 |
| සභාව සතු භූමිය කුලියට දීම - එක් දිනකට | රු.5000.00 | රු.7500.00 |
| ඉඩම් වෙන්දේසි, ප්‍රසිද්ධ රැගුම් සඳහා බලපත්‍ර ලබා දීම | රු. 500.00 | - |
| ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අයදුම්පත් ගාස්තු | රු. 25.00 | - |
| දැන්වීම්/බැනර්/කටවුට් ප්‍රදර්ශනය සඳහා අයදුම්පත්‍ර ගාස්තු | රු. 25.0 | - |
| ජලය ලබා ගැනීමට මාර්ගය පළුදු කිරීම් පරීක්ෂා කිරීම සඳහා සේවා ගාස්තු | රු. 300.00 | රු. 500.00 |
| ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීම. | රු. 250.00 | රු. 500.00 |
| ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීම (නා.සං.අධිකාරියට අයත් වන) | රු. 750.00 | රු.1000.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ විදුලි බිල හා ජල බිල්පත් ගත් විට ඒවායෙහි මිල ගණන් වැඩි වීම නිසා ප්‍රාදේශීය සභාව මඟින් සේවා ලබා දීමට නම් වත්මනෙහි රටෙහි පවතින මිල ගණන් අනුව අකමැත්තෙන් වුව ද යම් යම් ගැලපීම් සිදු කර මුදල් වැඩි කිරීමට සිදු වන බවත් , සෑම දෙයකම ම මිල ගණන් ඉහළ යන විට සභාවට ද පැවති මුදලටම සේවා ලබා දීමට හැකියාවක් නොමැති බවටත් , මෙම මිල ගණන් වල සංශෝධනයන් සිදු විය යුතු නම් ඒ පිළිබඳව දැනුවත් කරන ලෙසත් ය.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ මෙම අවස්ථාවේ රටෙහි පවතින තත්වය අනුව මෙම වැඩි කිරීම ඉතා විශාල මුදලක් නොවන බවත් , මෙහි දී මුදල් වැඩි කරනවාට වඩා සභාවක් වශයෙන් ආදායම් මාර්ග සකසා ගෙන ආදායම් ලබා ගැනීමට තව තවත් උත්සාහ කිරීම සුදුසු බවත් , එවිට ජනතාවට සහනයක් ඇති බවත් , ගිය වර

සභාවේ දී කිරිදි ඇල්ල පිළිබඳව කතා කළා සේ ම පවතින දියඇලි නීත්‍යානුකුල ක්‍රමවේදයට පෞද්ගලික අංශයට ලබා දී හෝ සංවර්ධන කටයුතු සිදු කර සභාවට ලබා ගැනීම සුදුසු බවත් , වරින් වර සේවාවන් වෙනුවෙන් අය කරන මුදල් ඉහළ දමා අයවැය සමඟ සසඳා බලන විට එහි විශාල වෙනසක් සිදු වනවාද යන්නත් , අයවැය පරිපූරකයක් හෝ අතිරේක අයවැයක් සකස් කිරීමට සිදු වනවා ද යන්නත් ය.ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ සමහර වැය ශීර්ෂයන් වල එසේ වෙන් කළ මුදලට වඩා වියදම් වූ ශීර්ෂයන් ඇති බවත් , ඒවා සම්බන්ධව උපදෙස් ඉල්ලා ඉහළට යොමු කර ඇති බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සාපේක්ෂව සලකා බැලීමේ දී ආයතනය පවත්වා ගෙන යාමට මෙම මුදල් ඉහළ දැමීම නිවැරදි වුව ද මෙම මුදල් වැඩි කිරීම ජනතාවට දරා ගත නොහැකි බව ය.අනිත් ආයතන මෙන් මුදල් ඉහළ දැමීමට පළාත් පාලන ආයතන වලට චක්‍රලේඛයන් නිකුත් නොකරන බවත් , මේ ආකාරයට සභාවට යොමු කර එම මුදල් සංශෝධනය කර ගත යුතු බවත් , මුදල් ඉහළ දැමීම මඟින් ජනතාව අපේක්ෂා කරන සේවාව ඉෂ්ට කළ හැකි ද යන්නත් , මීට වෙනත් විලක්පයක්වත් නොමැති නම් ජනතාවට විනිවදභාවය හා විශ්වාසය ඇති වන පරිදිත් සේවාවන් වල මිල වැඩි කිරීමේ හේතුව පිළිබඳව අවබෝධ වන පරිදිත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතු බවත් , මෙහි දී මෙය අනුමත කර කඩිනමින් ම ක්‍රියාත්මක නොකර සංශෝධනය කළ යුතු ඒවා පිළිබඳව නැවත පුළුල්ව සාකච්ඡා කළ යුතු බවත් , සභා වාර්තා ද වට්ස් ඇප් මාර්ගයෙන් එවීමට එකඟ වීම මඟින් සුළු මුදලක් හෝ ඉතිරි කිරීමට සහය වන බවත් , නමුත් අනිත් ඒවාට වැය කරන මුදල් ප්‍රමාණය ඉහළ ගියහොත් එමඟින් ද ප්‍රතිඵලයක් නොමැති බවත් , සියලු දේ අරපිරිමැස්මෙන් භාවිතා කර උපරිමයෙන් ම ඉතිරි කර මෙම යෝජනා වලට පැමිණෙනවා නම් ගැටළුවක් නොමැති බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම යෝජනා 2023 වර්ෂයේ ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත් , සංශෝධන තිබේනම් සියලු දෙනා සමඟ සාකච්ඡා කර ඊළඟ සභාවට ලිඛිතව ඉදිරිපත් කරන ලෙසත් , එවා සලකා බලා ඊළඟ සභාවේ දී තීරණයක් ලබා ගැනීම සුදුසු බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ මෙහි දී වරිපනම් බදු ගෙවන බවට සහතික නිකුත් කිරීම සඳහා අය කරන ගාස්තු රුපියල් 500කින් ඉහළ දමා ඇති බවත් , වරිපනම් බදු මුදල් නිවැරදිව සභාවට ගෙවන අයගෙන් මුදල් වැඩි කිරීම සාධාරණ නොවන බවත් , ගිය මාසයට අදාල ගෙවීම් වාර්තාවේ සභාපතිතුමාගේ වාහනය සඳහා ඉන්ධන ලබා ගැනීමේ යම් පාලනයක් පැවති බවත් , නමුත් අගොස්තු මස ගෙවීම් වාර්තාවේ එය දක්නට නොමැති බවත් , පොදුවේ සෑම වාහනයකම ඉන්ධන පරිහරණය කිරීම පාලනයක් ඇතිව සිදු කර ගැනීමට කටයුතු කළ යුතු බවත් ය.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ වරිපනම් බදු ගෙවීමට ඇත්තේ සුළු මුදලක් බවත් , සභාවෙන් කිහිප වතාවක් ම තක්සේරු කරන ලෙස ඉල්ලීමක් කළ ද තක්සේරු දෙපාර්තමේන්තුවෙහි ඇති අකාර්යක්ෂමතාව හේතුවෙන් අවුරුදු ගණනකින් තක්සේරුවක් සිදු කර නොමැති බවත් , දීර්ඝ කාලයකට පෙර සිදු කළ තක්සේරුවක් අනුව දැනටමත් වරිපනම් බදු මුදල් අය කරන බවත් , තව ද වරිපනම් ගෙවන බවට නිකුත් කරන සහතිකය ජීවිත කාලයටම එක් අවස්ථාවක දී පමණක් ලබා ගන්නා බවත් , එම නිසා එම මුදල අය කිරීම අසාධාරණ නොවන බවත් ය.තව ද ගෙවීම් වාර්තාවෙහි මාස දෙකකට අදාලව ලබා ගත් ඉන්ධන සම්බන්ධව සඳහන් වන බවත් , මසකට අවස්ථා කිහිපයකදී ම කොළඹ යාමට සිදු වන බවත් , එවිට ඉන්ධන විශාල ප්‍රමාණයක් වැය වන නිසා ඉන්ධන වෙනුවෙන් විශාල මුදලක් වැය වන බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය අදහස් දක්වමින් පවසා සිටියේ සියලු දෙනාම අපහසුවෙන් ජීවත් වන බවත් , ඉහත වගුවෙහි වරිපනම් නම් වෙනස් කිරීමේ පෝරම ගාස්තු සංශෝධිත මුදල තුන්ගුණයකින් වැඩි වී ඇති බවත් , එම මුදල් වැඩි කිරීම සම්බන්ධව ක්‍රමවේදය කුමක් ද යන්නත් ය.ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ වත්මනෙහි රටෙහි පවතින මිල ගණන් අනුවත් , අනිත් සභාවන් සමඟ සසදා බලන විටත් අප ප්‍රාදේශීය සභාවෙන් ලබා දෙන සේවාවල් වෙනුවෙන් ද මිල වැඩි කිරීමක් කිරීමට සිදු වන බවත් , සංශෝධන තිබේනම් ලිඛිතව ඊළඟ සභාවට ඉදිරිපත් කරන ලෙසත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සභාව පවත්වා ගෙන යාමට ගාස්තු වැඩි කළ ද රටෙහි පවතින තත්වය අනුව කනස්සල්ල පළ කරන බවත් , ගාස්තු වැඩි කිරීමේ දී ජනතාව අපහසුතාවයට පත් වන බවත් , යෝජනා සම්බන්ධව සංශෝධන ලබා දීමට කටයුතු කරන බවත් , මාසික සභා වාර්තාව ද වට්ස් ඇප් මාර්ගයෙන් එවීමට කැමැත්ත පළ කර එමගින් සුළු මුදලක් හෝ ඉතිරි කරන බවත් , අවසානයේ අප සභාව මෙපමණ මුදලක් ඉතිරි කළ බවට මුළු රටටම ආදර්ශයක් විය හැකි නම් ඉතා වටිනා බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසා සිටියේ මේ වන විට ශ්‍රීලංකාව අධිඋද්ධමන තත්වයක පවතින බවත් , මිනිස්සු සෑම අතින් ම අපහසුවෙන් ජීවත් වන බවත් , සභාවක් ලෙස ජනතාවට සිදු කරන ජනතා සේවය සිදු කිරීමට මේ අවස්ථාවේ අපහසු බවත් , ඊට විසඳුමක් ලෙස මිල ගණන් වැඩි කිරීමේ ක්‍රමවේදයක් ආරම්භ කළ ද සුදුසු ම දේ වර්තමානයේ අලුතින් සිතා නව දෙයක් සිදු කිරීම බවත් , අලුත් අදහස් ගෙන මීට වඩා ගුණාත්මක දෙයක් කිරීමට හැකි නම් එය වටිනා බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ සභාවේ ඉදිරි කටයුතු සඳහා ප්‍රමාණවත් තරම් මුදල් නොමැති බවත් , එනිසා ප්‍රාදේශීය සභාවෙන් ලබා දෙන සේවාව වෙනුවෙන් රටෙහි පවතින මිල ගණන් අනුව මුදල් වැඩි කිරීමට සිදු වන බවත් ය.

**තීරණ අංක 04**

මෙම යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් විවිධ අදහස් ඉදිරිපත් කිරීම හේතුවෙන් එම යෝජනා හා සංශෝධනයන් ලිඛිතව ඉදිරිපත් කරන ලෙසත් , ඒවා සලකා බලා ඊළඟ සභා වාරයේ දී තීරණයක් ගැනීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**05.** වත්මන් අවධියේ පවතින ඩීසල් මිල සමඟ සසදා බලන විට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් කුලියට ලබා දෙන ජේ.සී.බී.යන්ත්‍රයෙහි ගාස්තු සංශෝධනය කිරීමට යෝජනා කරමි.

| යන්ත්‍රය | පැවති ගාස්තුව | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| ජේ.සී.බී.යන්ත්‍රය පැයක් සඳහා | රු.4,500.00 | රු.6,000.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 05**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් කුලියට ලබා දෙන ජේ.සී.බී.යන්ත්‍රයට ඉන්ධන සඳහා විශාල මුදලක් ගෙවීමට සිදු වීම , නඩත්තු කිරීම සඳහා වැය වන පිරිවැය ඉහළ යාම ආදිය හේතුවෙන් ජේ.සී.බී.යන්ත්‍රයෙහි ගාස්තු ඉහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06.** සතිපොළ භූමිය සහ සතිපොළ අසල රථගාල කුලියට දීමේ දී වැය වන විදුලි හා ජල ගාස්තුව ඉහළ යාම හේතුවෙන් අය කරන ගාස්තු සංශෝධනය කිරීමට යෝජනා කරමි.

| කාරණය | පවතින ගාස්තුව | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| සතිපොළ භූමිය කුලියට දීම. | රු.5,000.00 | රු.7,500.00 |
| සතිපොළ අසල රථ ගාල කුලියට දීම. | රු.5,000.00 | රු.7,500.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 06**

මෙම යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් විවිධ අදහස් ඉදිරිපත් කිරීම හේතුවෙන් එම යෝජනා හා සංශෝධනයන් ලිඛිතව ඉදිරිපත් කරන ලෙසත් , ඒවා සලකා බලා ඊළඟ සභා වාරයේ දී තීරණයක් ගැනීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**07.**1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වැනි වගන්ති ප්‍රකාරව දැන්වීම් පුවරු අය කරන ගාස්තුව පහත පරිදි සංශෝධනය කිරීමට යෝජනා කරමි.

| කාරණය | පවතින ගාස්තුව | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| බිත්තියක හා පුවරුවක සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීම් සඳහා සෑම වර්ග අඩි 01 කට වර්ෂයක් සඳහා | රු. 75.00 | රු.150.00 |
| ඩිජිටල් දැන්වීම් පුවරු සඳහා වර්ග අඩි 01කට වර්ෂයක් සඳහා | රු.125.00 | රු.300.00 |
| බැනරයක් හෝ කටවුට් මඟින් ප්‍රදර්ශනය කිරීම. – | | |
| ✓ මාසයක කාලයක් සඳහා වර්ග අඩි 01කට | රු. 30.00 | රු. 75.00 |
| ✓ මාස 03 කාලයක් සඳහා වර්ග අඩි 01කට | රු. 40.00 | රු.100.00 |
| ✓ මාස 03කට වැඩි කාලයක් සඳහා වර්ග අඩි 01කට | රු. 50.00 | රු.150.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>තීරණ අංක 07</u>

මෙම යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් විවිධ අදහස් ඉදිරිපත් කිරීම හේතුවෙන් එම යෝජනා හා සංශෝධනයන් ලිඛිතව ඉදිරිපත් කරන ලෙසත් , ඒවා සලකා බලා ඊළඟ සභා වාරයේ දී තීරණයක් ගැනීම සුදුසු බවටත් ඒකමතිකව සහා සම්මත විය.

**08.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදු කරනු ලබන තාවකාලික වෙළඳ ව්‍යාපාර පවත්වා ගෙන යන ව්‍යාපාරිකයින්ගෙන් දෛනිකව ගාස්තුවක් පහත පරිදි අය කර දෛනික අවසර පත්‍රයක් ලබා දීම සුදුසු බවටත් , ප්‍රාදේශීය සභාව මඟින් දැනුම් දෙනු ලබන ඕනෑම අවස්ථාවක තාවකාලික වෙළඳ ව්‍යාපාර අදාළ ස්ථාන වලින් ඉවත් කර ගැනීමට ව්‍යාපාර හිමියන් කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| | ගාස්තුව |
|---|---|
| • මුහුණත දිග අඩි 5ට අඩු | රු. 50.00 |
| • මුහුණත දිග අඩි 5ත් 10ත් අතර | රු.100.00 |
| • මුහුණත දිග අඩි 10ට වැඩි | රු.150.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>තීරණ අංක 08</u>

මෙම යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් විවිධ අදහස් ඉදිරිපත් කිරීම හේතුවෙන් එම යෝජනා හා සංශෝධනයන් ලිඛිතව ඉදිරිපත් කරන ලෙසත් , ඒවා සලකා බලා ඊළඟ සභා වාරයේ දී තීරණයක් ගැනීම සුදුසු බවටත් ඒකමතිකව සහා සම්මත විය.

**09.2023** වර්ෂය සඳහා ආදායම් පැනවීම සම්බන්ධ යෝජනා සභාවට ඉදිරිපත් කිරීම.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>තීරණ අංක 09</u>

2023 වර්ෂය සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන සේවාවන් හා පහසුකම් ගාස්තු සංශෝධනය කිරීමට ඉදිරිපත් වූ යෝජනා සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් විවිධ අදහස් ඉදිරිපත් කිරීම හේතුවෙන් ඊළඟ සභා වාරයේ දී එම යෝජනා හා සංශෝධනයන් සලකා බලා 2023 වර්ෂය සඳහා ආදායම් පැනවීම සම්බන්ධ යෝජනා සමබන්ධව තීරණයක් ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**10.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අළුතින් ඉදිකරන ලද වාහන සේවා ස්ථානයේ සේවා කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය වාහන අමතර කොටස් හා උපකරණ ලබා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

<u>වාහන අමතර කොටස්</u>

| අනු අංකය | වාහන වර්ගය | අවශ්‍ය අමතර කොටස | විස්තරය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | ස්ටැන්ඩර්ඩ් වර්ගයේ ට්‍රැක්ටර් රථ | එයාර් ෆිල්ටර් | A- 8599<br>A - 8505 | 08<br>08 |
| | | ඩීසල් ෆිල්ටර් | 9451037407 | 08 |
| | | " " | F002H20286 | 08 |
| 02 | මැසි ෆර්ගසන් 240 ට්‍රැක්ටර් රථ | ඔයිල් ෆිල්ටර් | - | 02 |
| | | ඩීසල් ෆිල්ටර් | - | 04 |
| 03 | ටැෆේ ට්‍රැක්ටර් රථ | ඔයිල් ෆිල්ටර් | - | 02 |
| | | ඩීසල් ෆිල්ටර් | - | 04 |
| 04 | ඉසුසු FRR රථය | ඔයිල් ෆිල්ටර් | C1513 | 02 |
| | | ඩීසල් ෆිල්ටර් | FC - 174 | 02 |
| 05 | මහේන්ද්‍ර බොලෙරෝ රථය | ඩීසල් ෆිල්ටර් | FC- 321 | 02 |
| | | ඔයිල් ෆිල්ටර් | C - 512 | 02 |
| | | එයාර් ෆිල්ටර් | A-4403 | 02 |
| 06 | නිසාන් ඩබල් කැබ් | ඩීසල් ෆිල්ටර් | FC 2265 | 02 |
| | | ඔයිල් ෆිල්ටර් | C - 209 | 02 |
| | | එයාර් ෆිල්ටර් | A- 8548 | 02 |
| 07 | මිට්ෂුබිසි L200 කැබ් රථය | ඩීසල් ෆිල්ටර් | F -19305K | 02 |
| | | ඔයිල් ෆිල්ටර් | C 1008 | 02 |
| | | එයාර් ෆිල්ටර් | A -3026 | 02 |
| 08 | පියාජියෝ ඩීසල් ත්‍රීවිලරය | ඩීසල් ෆිල්ටර් | - | 02 |
| | | ඔයිල් ෆිල්ටර් | - | 02 |

09. DS 40 ඔයිල් - ලීටර් 210 ක්
10. MP3 ග්‍රීස් - කිලෝ 40 ක්

<u>අවශ්‍ය උපකරණ</u>

1. ෆිල්ටර් අඬු - 01 (ඕනෑම ෆිල්ටරයක් ගැලවිය හැකි )
2. 2 Kg ග්‍රීස් ගන් - 01
3. අධි පීඩන සේදුම් යන්ත්‍ර හෝස් පවර් 02 (ප්‍රෙෂර් ගන්) - 01
4. ලොකු ප්‍රමාණයෙන් යුත් ස්පැනර් -01
5. විදුලි බලයෙන් ක්‍රියා කරන ලීටර් 200 න් යුත් සම්පීඩක උපකරණ පිස්ටන් 02 හෝ 03
( electric pressure Gun / 200 L) - 01

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ මෙය තාක්ෂණික කමිටුවකින් නියමාකාරව සිදු විය යුතු බවත් , මේ සඳහා ලබා ගන්නා උපකරණ නිවැරදිව ලේඛන ගත කළ යුතු බවත් , නැතිනම් තව කාලයක් ගත වූ පසුව ප්‍රශ්න ඇති විය හැකි බවත් ය.තව ද වාහනයක තෙල් මාරු කළ පසු එම මාරු කළ තෙල් නැවත සභාවට රැගෙන ආ යුතු බවත් , ඒවා විශාල මුදලකට රැගෙන යාමට මිනිසුන් සිටින බවත් , ඒවා සම්බන්ධව මීට වඩා සිතා බලා කටයුතු කළ යුතු බවත් ය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ එහි දී ගැටළුවක් ඇති නොවන බවත් , ඊට අදාල සියලු දේවල් ගබඩා ඉන්වෙන්ට්‍රියට ඇතුලත් කර ගබඩා ලැබීම් ලෙස ගෙන ඉන්පසුව නිකුත් කරන බවත් , කාර්මික නිලධාරීතුමාගේ නිරන්තර අධීක්ෂණය මේ සඳහා ලබා ගන්නා බවත් ය.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මුදල් කාරක සභාවේ දී නෝමන් පෙරේරා යන පුද්ගලයාට ට්‍රැක්ටර් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවන බවත් , එම තැනැත්තා ඒ පිළිබඳව පුහුණුවක් ලබා ගෙන ඇති බවට සහතිකයක්වත් නොමැති බවත් , කිසිම තාක්ෂණික දැනුමක් නොමැති පුද්ගලයෙක් බවත් , මුදල් ගෙවීමේ දී විනිවිදභාව තිබිය යුතු බවත් , තාක්ෂණික කමිටුවකින් බලා එම තැනැත්තාට සභාවේ වාහන අළුත්වැඩියාවට අවස්ථාව ලබා දීම සුදුසු බවත් , ට්‍රැක්ටර් වල අළුත්වැඩියාවන්ට සභාව මඟින් ලබා දෙන කොටස් එම තැනැත්තා සවි කරනවාද යන්න සැක සහිත බවත් , මේවා පිළිබඳව නිරීක්ෂණය කිරීමට ඒ පිළිබඳව දැනුම ඇති පුද්ගලයෙක් අවශ්‍ය බවත් ය.

ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ එය කෙසේවත් පිළිනොගන්නා බවත්, පැල්මඩුල්ලෙහි ට්‍රැක්ටර් සෑදීමට සිටින එක ම පුද්ගලයා ඔහු බවත් , ට්‍රැක්ටර් අළුත්වැඩියා කිරීමට වෙනත් ස්ථාන වලට රැගෙන ගියහොත් ට්‍රැක්ටරයේ කොටස් හා අළුත්වැඩියාව සඳහා සභාව විසින් ලබා දෙන කොටස් පවා නොමැති වන බවත් , එම පුද්ගලයාට සහතිකයක් තිබේ ද යන්න මෙහි දී නොසලකන බවත් , කසළ එකතු කිරීම අත්‍යවශ්‍ය සේවාවක් නිසා ට්‍රැක්ටර් රථ දිනපතා සේවය ලබා දීමට අවශ්‍ය බවත් , ලේකම්තුමා හා කාර්මික නිලධාරීතුමා ඇතුළු සියලු දෙනා වාහන අළුත්වැඩියාවන් ඇතුළු සෑම අවස්ථාවකදී ම අවධානයෙන් සිටින බවත් ය. තව ද එම තැනැත්තා නිසා මෙතරම් හෝ අඩු මුදලකට ට්‍රැක්ටර් රථ අළුත්වැඩියාවන් කර ගැනීමට හැකි වන බවත් , අවශ්‍ය කොටස් සභාවෙන් ලබා දී අළුත්වැඩියාවන් සිදු කිරීම සභාවට වාසියක් වන බවත් , රාජ්‍ය ආයතනයක් වන ඩෙක්මා ආයතනය මඟින් අළුත්වැඩියාවන් කළහොත් මීට වඩා විශාල මුදලක් වැය වන බවත් , ට්‍රැකටර් රථ අළුත්වැඩියාවන් කළ හැකි පුද්ගලයෙක් සිටී නම් සභාවට හඳුන්වා දෙන ලෙසත් ගරු සභාපතිතුමා ඉල්ලා සිටින ලදී.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ පසුගිය කාලයේ ට්‍රැක්ටර් රථ අළුත්වැඩියාවන්ට පමණක් විශාල මුදලක් වැය වූ බවත් , නමුත් එක් ට්‍රැක්ටරයක් පමණක් ධාවනය වන බවත් , කසළ එකතු නෙකරන බවට මිනිස්සු චෝදනා කරන බවත් ය.ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම ට්‍රැක්ටර් රථ අවුරුදු ගණනාවකට පෙර සභාවට ලැබුනු ට්‍රැක්ටර් රථ වන බවත් , අත්‍යවශ්‍ය සේවාවක් වන කසළ එකතු කිරීම සඳහා නිරන්තරයෙන් ට්‍රැක්ටර් රථ ධාවනය කිරීමේ දී නිරන්තර දෝෂ ඇති වන බවත් , දෛනිකව සේවා සැපයීමට අළුත්වැඩියාවන් කිරීමට සිදු වන බවත් , අළුත්වැඩියාවන්ට කොටස් සෙවීම ද අපහසු කාර්යයක් බවත් , මේ හේතුවෙන් එම ට්‍රැක්ටර් වෙන්දේසි කර අලුත් ට්‍රැක්ටර් 2ක් ලබා ගැනීමට හැකි නම් වටිනා බවටත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ එම ට්‍රැක්ටර් රථ වෙන්දේසි කර අළුත් ට්‍රැක්ටර් රථ 2ක් ලබා ගැනීමට තමන් ද එකඟ වන බවත් , සභාවේ බැකෝ යන්ත්‍රයට ද විශාල මුදලක් වැය වන බවත් ය.අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ තාක්ෂණික කමිටුවක් කැඳවා මෙම ට්‍රැක්ටර් රථ සම්බන්ධව තීරණයක් ලබා ගැනීම සුදුසු බවත් , එවිට ට්‍රැක්ටර් රථ වෙන්දේසි කර අලුත් ට්‍රැක්ටර් රථ ලබා ගත හැකි බවත් , දැනට පවතින ට්‍රැක්ටර් රථ ධාවනය කිරීමේ දී ඇති වන අපහසුතාවයන් වළක්වා කාර්යක්ෂම සේවාවක් ලබා දීමට එය සාධාරණ වන බවත් , එනිසා මේ සම්බන්ධව ඊළඟ සභාවට යෝජනාවක් ඉදිරිපත් කිරීම සුදුසු බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පියසේන මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ තමන් රාජකාරී කරන ආයතනයේ ද එක් අවස්ථාවක දී ජේ.සී.බී. යන්ත්‍රයෙහි යාන්ත්‍රික දෝෂයක් පැමිණි බවත් , එහි දී ඒ සම්බන්ධව ආයතනයේ සේවය කරන සේවකයින් විශාල මුදලක් යන බවට පැවසූ බවත් , එනිසා කොළඹින් පුද්ගලයෙක් කැඳවා එම යාන්ත්‍රික දෝෂය අඩු මුදලකට සකස් කිරීමට හැකි වූ බවත් , සභාවේ වාහන අළුත්වැඩියාවන් වල දී ද ඒ හා සම්බන්ධව දැනුම ඇති වෙනත් පුද්ගලයින් සිටිනවා ද යන්න සලකා බැලීම සුදුසු බවය.ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ කසළ එකතු කිරීම අත්‍යවශ්‍ය සේවාවක් නිසා ඒ ආකාරයට ට්‍රැක්ටර් රථ අළුත්වැඩියාවන් කළ හැකි කිසිවෙකු හෝ සිටී නම් හඳුන්වා දෙන ලෙස ය.

යම්කිසි කටයුත්තකදී තාක්ෂණික නිලධාරියා විසින් සටහන දමන්නේ සුදුසු කාර්මික නිලධාරියෙකුගේ අනුමැතිය යටතේ කරන ලෙසට බව ගරු උප සභාපතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදී.ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ එවැනි අවස්ථාවන්හිදී රත්නපුර ඩිපෝ ආයතනයට යවා ඩිපෝ ඉන්ජිනේරුතුමාගෙන් අනුමැතිය ලබා ගත හැකි බවත් , එවිට රත්නපුර ඩිපෝවට එම වාහනය ඇද ගෙනයාමට හෝ ඩිපෝ ඉන්ජිනේරුතුමාව අප සභාව වෙත ගෙන්වා ගැනීමට සිදු වන බවත් , එය ප්‍රායෝගිකව සිදු කිරීමට අපහසු බවත් , එහි දී විශාල මුදලක් ඒ සඳහා වැය වන බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ තමන්ට තාක්ෂණික දැනුම නොමැති නිසා තාක්ෂණික නිලධාරියෙකුගේ සහතිකය නොමැතිව අත්සන් කළ විට ඒ සඳහා සහයෝගය ලබා දුන් බවට ගැටළු ඇති විය හැකි බව ය.ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ එමඟින් සභාවට හානියක් හා අවාසියක් සිදු වී නොමැති බවටත් සභාව වරදක් කර නොමැති බවටත් ප්‍රායෝගිකව එසේ කළ නොහැකි බවටත් ඕනෑම අවස්ථාවක ඔප්පු කළ හැකි නිසා ගැටළුවක් ඇති නොවන බවත් , එසේ නම් මීට පෙර විගණන විමසුම් පැමිණිය යුතු බවත් , එසේ විගණන විමසුම් නොපැමිණියේ මෙවැනි ගැටළු නොමැති නිසා බවත් , නමුදු එසේ කළ යුතු බවට සභාව අදහස් ඉදිරිපත් කරන්නේ නම් ඒ ආකාරයට දෝෂ ඇති වන වාහන රත්නපුර ඩිපෝ ආයතනය යැවීමට හෝ ඩිපෝ ඉන්ජිනේරුතුමාව සභාවට ගෙන්වා අවශ්‍ය කටයුතු කළ හැකි බවත් , එවිට ඒ සඳහා කාලය තව වැඩි වනවා පමණක් බවත් ගරු සභාපතිතුමා පෙන්වා දෙන ලදී.

**තීරණ අංක 10**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අළුතින් ඉදිකරන ලද වාහන සේවා ස්ථානයේ සේවා කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය වාහන අමතර කොටස් හා උපකරණ ලබා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**06. කාරක වාර්ථා සලකා බැලීම - 2022-08-18 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම.**

2022-08-18 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.ආරියරත්න මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.වී.අජිත් නිශාන්ත මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**07. 2022-08-01 සිට 2022-08-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සලකා බැලීම.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ආදායම් වාර්තාවේ එකතුවෙහි වෙනස්කම් ඇති බවත් ඒ පිළිබඳව අධ්‍යනය කළ කර සභාවට පැහැදිලි කර දිය යුතු බවත් ය.

ඒ අනුව 2022-08-01 සිට 2022-08-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**08. වෙනත් කරුණු.**

- **සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම්.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා</u>**

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා පවසා සිටියේ රජය මඟින් තැපැල් කාර්යාලය හරහා වැඩිහිටියන්ට ලබා දෙන වැඩිහිටි දීමනාව සමෘද්ධි බැංකුව හරහා ලබා දෙන බවට ප්‍රාදේශීය ලේකම්තුමාගේ දැනුවත් වීම යටතේ තැපැල් කාර්යාල අසල දැන්වීමක් ප්‍රදර්ශනය කර ඇති බවත් , එහි දී සමෘද්ධි බැංකුව වෙත යාමට ප්‍රවාහන ගාස්තු සඳහා විශාල මුදලක් වැය වන බවටත් , වැඩිහිටියන් අසරණ තත්වයට පත් වී ඇති බවත් , ජනයා මේ පිළිබඳව තොරතුරු තමන්ගෙන් විමසුව ද නිශ්චිත පිළිතුරක් ලබා දීමට දැනුවත් වීමක් නොමැති බවත් , මෙහි මූලික අරමුණ කුමක් ද යන්නත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය අදහස් දක්වමින් පවසා සිටියේ වැඩිහිටියන් මෙම වෙනසට කැමත්තක් නොමැති බවත් , තමන්ගේ වසමේ ද මෙම ගැටළුව පවතින බවත් , සමෘද්ධි බැංකුව සඳහා පනාවැන්නට යාමට සිදු වන බවත් , වැඩිහිටියන් ඉල්ලා සිටින්නේ පෙර ගෙවීම් කළ ආකාරයටම ගෙවීම් සිදු කරන ලෙසත් බව ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ සමහර වැඩිහිටියන් ඉතා අසාධ්‍ය තත්වයේ පවතින රෝගීන් බවත් , නිවස ආසන්නයේ තැපැල් කාර්යාලය පිහිටීම නිසා ඔවුන්ට පහසුවක් වූ බවත් , මෙසේ සමෘද්ධි බැංකුව වෙත යාමට නොව ග්‍රාම නිලධාරී , සමෘද්ධි නිලධාරී හරහා වැඩිහිටියන්ගේ නිවෙස් වලටම වැඩිහිටි දීමනාව යැවීමට හැකි නම් වටින බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ යහපාලන ආණ්ඩුව සමයේ සමෘද්ධිය නොමැති අයට අභියාචනා ඉදිරිපත් කළ පසු එම පිළිවෙලට සමෘද්ධිය ලබා දීමට කටයුතු සකස් කළ බවත් , සමෘද්ධි සහනාධාර ලෙස රු.10,000.00 ලබා දුන් අවස්ථා වල දී සමෘද්ධි සංවර්ධන නිලධාරීන් රු.100.00 ක් ලබා ගෙන ගිණුමක් ආරම්භ කරන බවත් , මෙම මුදල් සොයා බැලීමකින් තොරව සාමාන්‍යයෙන් වැඩ කළ හැකි තරුණ තරුණියන් සිටින පවුල් වලට හා මුදල් උපයන අයට ලබා දී ඇති බවත් , අසරණව ජීවත් වන අපහසුවෙන් ආර්ථිකය පවත්වා ගෙන යන පවුල් වලට නොලැබෙන බවත් , එනිසා තමන් ලිඛිතව මේ සම්බන්ධව පරීක්ෂණයක් සිදු කර සාධාරණව ලබා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් ඉල්ලීමක් කළ බවත් , නමුත් එය සාර්ථක නොවූ බවත් , වැඩිහිටි දීමනාව ද සමෘද්ධි කාර්යාලයට ලබා දුන්නහොත් එයට ද අවසානයේ මෙය සිදු වන බවත් එනිසා මෙයට විරුද්ධ විය යුතු බවත් , ලබා දුන් ආකාරයට ම වැඩිහිටි දීමනාව ලබා දීම සුදුසු බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ රජය විසින් ජනයාට විවිධ දීමනා ලබා දෙන බවත් , සමහර ජනයා තම දරුවන්ගේ වාහන වල ඇවිදින් මෙම දීමනා රැගෙන යන බවත් , මිනිස්සු දීමනාවන් ලබා ගැනීමට පුරුදු වී ඇති බවත් , මෙය නතර කළ යුතු බවත් , පොහොසත් ජනයාද මෙම දීමනා ලබා දෙන ලෙස ඉල්ලීම් කරන බවත් , එම දීමනා වලින් මත්ද්‍රව්‍ය ලබා ගන්නා ජනයා ද සිටින බවත් , රජය මඟින් අපේ රට තුළ හිඟන්නු ඇති කරන බවත් , ජීවත් වෙන්න අපහසු පුද්ගලයින්ට මෙම දීමනා ලබා දීම ගැටළුවක් නොවන බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ප්‍රාදේශීය ලේකම්තුමා විසින් මෙවැනි තීරණයක් ගන්නට ඇත්තේ රජය ලබා ගත් ප්‍රතිපත්තියක් අනුව විය හැකි බවත් , විද්‍යුත් ක්‍රමයට සියලු තොරතුරු ගෙන සුදුසුකම් ලැයිස්තුවක් ලබා ගෙන වැඩිහිටි දීමනාව ලබා දීමට කටයුතු කරනවා විය හැකි බවත් , සියලු පවුල් වල තොරතුරු ලබා ගෙන ලකුණු සීමාවක් දමා ඒ අනුව සමෘද්ධිය ලබා දීමට කටයුතු සූදානම් කරනවා විය හැකි බවත් , මේ සම්බන්ධව රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයෙන් විමසීමක් කරන බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ රජය මඟින් ක්‍රියාත්මක කරන්නට යෙදුන ජාතික පාසල් 1000 ආරම්භ කිරීමේ වැඩසටහන පිළිබඳව ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් විමසා එය ක්‍රියාත්මක කිරීමට කටයුතු සලසා දෙන ලෙස ය.එය නැවතී තිබේ නම් ඒ පිළිබඳව සොයා බලන ලෙසත් , පාතකඩ බෞද්ධ විද්‍යාලය ජාතික පාසලක් ලෙස තෝරා ගැනීම සම්බන්ධව එහි පළමු ශිෂ්‍යයා වශයෙන් ලොකු සතුටක් හා ආඩම්බරයක් ඇති වූ බවත් , ලෙල්ලොපිටිය රාහුල හා ධර්මාලෝක වැනි පාසල් ද ඒ සඳහා තෝරා ගැනීම සම්බන්ධවත් ගරු සභාපතිතුමා හා ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමියට ස්තුතිවන්ත වන බවත් ය.

තව දුරටත් අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා පවසා සිටියේ 1991 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා රත්නපුර ප්‍රාදේශීය සභාවේ අකිල රොෂාන් මන්ත්‍රීතුමන්ගේ පියාණන් වන හා රත්නපුර ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කළ අයි.ඩබ්.විජේරිස් මැතිතුමා අභාප්‍රාප්ත වන්නට වූ බවත් , එතුමා ගරු ධර්මදාස වන්නිආරච්චි මැතිතිමා සමඟ එකතු වී බටේවෙල නම් දුෂ්කර ප්‍රදේශයට විශාල සේවයක් කළ බවත් , ක්‍රියාකාරී සාමාජිකයෙක් බවත් , පක්ෂ විපක්ෂ සියලු දෙනාගේ ම ශෝකය ප්‍රකාශ කරන බවත් ය. මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ එතුමා දීර්ඝ කාලයක් තිස්සේ සමාජ සේවා කටයුතු වල නිරත වෙමින් දේශපාලන පක්ෂ ගණනාවක් සමඟම ඉතා සමීපව කටයුතු කරමින් බටේවෙල නම් දුෂ්කර ප්‍රදේශයට විශාල සේවයක් කළ බවත් , දීර්ඝායුෂ විඳ අභාවප්‍රාප්ත වූ ගරු විජේරිස් මැතිතුමාට මුළු සභාවේ ම ශෝකය ප්‍රකාශ කරන බවත් , ලිඛිතව ශෝක පණිවිඩයක් නිකුත් කිරීමට කටයුතු කරන බවත් ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ රත්නපුර දිස්ත්‍රික්යේ ඉපදුන අපිට මැණික් උරුමයක් බවත් , නමුත් අද වන විට මැණික් පතල් හේතුවෙන් විවිධ ආපදා වලට මුහුණ දීමට සිදු වී ඇති බවත් , මැණික් ගැරීම වරදක් නොවුන ද එහි දී සමාජය ගැන ද අවධානයෙන් සිටිය යුතු බවත් , ඉහල හමුවත් පහළ හකමුවත් අතර කොටසක තිබෙන පතලක් හේතුවෙන් තව කිහිප දිනකින් හකමුව මාර්ගයෙන් රත්නපුර දක්වා ගමන් කිරීමට නොහැකි තත්වයක් උදා වන බවත් , මේ හේතුවෙන් අඩි 12ක් පමණ තිබූ මාර්ගය අද වන විට අඩි 1 2/1 ක් වත් නොමැති බවත් , මෙම පතල හේතුවෙන් ඉවුරු කඩා ගෙන මාර්ගය දෙසට එන බවත් , පවතින කාලගුණික තත්වය මත අයහපත් තත්වයක් උදා විය හැකි බවත් , මේ සඳහා විසඳුමක් අවශ්‍ය බවත් , පොලීසියට මේ පිළිබඳව දැනුම් දුන්න ද නිශ්චිත විසඳුමක් නොලැබුන බවත් , මේ පිළිබඳව විමසීමට තමන් ඇතුළු පිරිස එම ස්ථානයට යන විට ක්ෂණිකව එම පිරිස එම ස්ථානයෙන් ඉවත්ව යන බවත් , රාත්‍රියෙහි මෙහි වැඩ සිදු කරන බවත් , මේ සම්බන්ධව විශේෂ කාර්යය බලකායට හෝ භාර දී අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවත් , මෙම මාර්ගය නැති වුවනොත් අපට විශාල සම්පතක් නැති වන බවත් ය.

තව ද හකමුව ජල ව්‍යාපෘතියෙහි කටයුතු තාවකාලිකව නැවතී ඇති බවත් , කුමන තාක්ෂණික හෝ මුදල්මය ගැටළුවක් මීට බලපෑම් කළා ද යන්නත් , මෙහි වැඩ 90% ක් පමණ සිදු කර තිබූ බවත් , අවසන් කිරීමට තිබුනේ 10%ක පමණ සුළු වැඩ කොටසක් බවත් , ජලය පිළිබඳව විශාල බලාපොරොත්තුවකින් සිටි බවත් , මේ සම්බන්ධව කරුණු සලකා බලන ලෙසත් ය.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා පැවසූ පරිදි ආධාර ලබා දෙන විට මිනිස්සු ඒවා ලබා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින බවත් , රාජ්‍ය නිලධාරීන් ප්‍රමාණය ද වැඩි බවත් , කිසිම හේතුවක් අවශ්‍යතාවයක් නොමැතිව රජයේ රැකියා බොහොමයක් ලබා දී ඇති බවත් , කුඩා අවධියේ ග්‍රාම සේවක විසින් ගමේ සියලු රාජකාරිමය කටයුතු සිදු කළ නමුදු වත්මනෙහි සමෘද්ධි නිලධාරී , ආර්ථික සංවර්ධන නිලධාරී වශයෙන් නිලධාරීන් කිහිප දෙනෙක් ම එම රාජකාරීන් කළ ද පෙර පරිදි රාජකාරීන් සිදු නොවන බවත් , වැඩිහිටි දීමනාව ලබා දීමට ද සමෘද්ධි නිලධාරින්ට ලබා දුන්නහොත් එය ද පෙර පරිදි නොවීමට ඉඩ ඇති බවත් ය.

ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම පතල් කපන ස්ථානය පිළිබඳව සියලු තොරතුරු ඇතුලත් කර සබරගමුව පළාත් ජ්‍යෙෂ්ට නියෝජ්‍ය පොලිස්පතිතුමාට අද දිනම ලිපියක් යැවීම සුදුසු බවත් ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ නායක ධූරය සඳහා තෝරා ගැනීම සම්බන්ධව ජනාධිපතිතුමාට ස්තූතිය වන බවත් කණ්ඩායමක් ලෙස සියලු දෙනා සමඟ ම ඉදිරියට කටයුතු කරමු යන්නත් ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ නායක ධූරයෙන් ඉවත් කිරීම සම්බන්ධව ස්තූතිවන්ත වන බවත් , පක්ෂ වල නොසිටිමින් ජනතාව සමඟ සිටින බවත් , සියලු කටයුතු සඳහා සහය වන බවත් ය.

- **පසුගිය සභාවේ ලබා ගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගිතිය සාකච්ඡා කිරීම.**
- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වය හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමියහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර විසින් ස්ථිර කරන ලදී.

- **මීළඟ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.**

මහා සභාව 2022 ඔක්තෝම්බර් 13 වන දින පැවැත්වීමට තීරණය විය.

- **සභාපතිතුමාගේ ස්තූති කතාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උපසභාපති තුමන්, විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් , මාධ්‍යවේදී මහතාටත් ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තූති කතාව අවසන් කරන ලදී.

**පෙ.ව. 11.17 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.**

ලේකම්
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022-09-28 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදීය.

ප්‍රාදේශීය සභා ................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ..................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2022-10-13 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව